අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

| | | | |
|---|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. | ED/04/58/06/01/12 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date: 2024.07.01 |

නම ...................................................................

ලිපිනය ...................................................................

...................................................................

ජා.හැ. අංකය ...................................................................

මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනෙවියනි,

**<u>සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම - 2020/2021 (2022)</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2231 හා 2021.06.04 දිනැති ගැසට් නිවේදනය අනුව 2022.03.26 දින විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණයේ සහ 2024.05.18 හා 2024.05.19 දෙදින තුළ පැවති සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවෙහි ප්‍රමුඛතාව අනුව සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලබාදීම සඳහා ඔබ තෝරා ගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ අනුව ඔබ වෙත පත්වීම් ලිපි ප්‍රදානය කිරීමේ උත්සවය 2024.07.03 වන බදාදා දින පෙ.ව. 09.00 ට අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පැවැත්වීමට නියමිතය. එබැවින් එම උත්සවයට සහභාගී වීම සඳහා ඔබ එදින පෙ.ව. 07.00 වනවිට ජාතික හැඳුනුම්පත රැගෙන ගංගාරාම විහාරස්ථානය (බේරේ වැව) අසල පිහිටි ඇතුළුවීමේ දොරටුවෙන් පමණක් අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාව වෙත ප්‍රවිශ්ට විය යුතු වේ. (ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය සහතික කළ හැකි ලේඛනයක් රැගෙන ඒම අනිවාර්ය වේ.)

03. පිරිමි පත්වීම්ලාභීන් ජාතික ඇඳුමෙන් හෝ කළු කලිසම, සුදු කමිසය සහ ටයි පටියකින් සැරසිය යුතු අතර, කාන්තා පත්වීම්ලාභීන් සුදු හෝ ක්‍රීම් පැහැයෙන් යුතු සාරියකින් හෝ ඔසරියකින් සැරසී පැමිණිය යුතුය.

04. එදිනට ඔබ වෙත ලබාදෙන අංකය **අනිවාර්යයෙන්ම ඇඳුමේ වම්පස ඉහළින් පැළඳිය** යුතු අතර පත්වීම් ප්‍රදානෝත්සවයේ කටයුතු අවසන් වනතුරු ශාලාවේ රැඳී සිටිය යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

05. මෙම උත්සවය සඳහා පත්වීම්ලාභීන් පමණක් සහභාගී විය යුතු අතර වෙනත් කිසිදු පුද්ගලයෙකු උත්සව ශාලාව වෙත රැගෙන ඒමට අවසර දෙනු නොලැබේ.

06. මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

මෙයට විශ්වාසී,

ආචාර්ය කේ. පී. මුනගම
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට